රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:- 305

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1985 සැප්තැම්බර මස 5 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

1. දුම්රියේ ගමන් කළ හැකි පන්තිය.
2. සති අන්තවල හා ප්‍රසිද්ධ නිවාඩු දින වල රාජකාරියෙහි යෙදීමට ගෙවීම.
3. කාර්යස්ථාන දීමනා.
4. රජයේ නිලධරයන්ට සහ රාජ්‍ය සංස්ථා සේවකයන්ට ගෙවන අනියම් දීමනා සංශෝධනය කිරීම.

පහත 1,2 හා 3 ඡේද යටතේ ගෙවීම්සඳහා 1985 දී ඉතිරි කිරීම් ද
1986 සිට ප්‍රතිපාදනද යොදා ගතයුතුය.

1. <u>දුම්රියේ ගමන් කළ හැකි පන්තිය</u>

අංක 197 හා 1981 දෙසැම්බර 29 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ
4(xxii) ඡේදය යොමුවේ.

වාර්ෂික
රු.18600 කට වැඩි නව ඒකාබද්ධ/වැටුපක් ලබන රජයේ නිලධරයෙකු
දුම්රියේ 1 පන්තියේ ගමන් කිරීමට හිමිකම් ලබයි.

2. <u>සති අන්තවල හා ප්‍රසිද්ධ නිවාඩු දිනවල රාජකාරියෙහි යෙදෙන සමහර නිලධාරීන්ට කරන ගෙවීම්.</u>

අංක 256 හා 1984.06.12 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ
1 හා 2 ඡේද යොමුවේ.

(i) චක්‍රලේඛයේ 1 ඡේදයේ දක්වා නොමැති හදිසි රාජකාරිවල නිරතවීමට සිදුවන විටද නිලධාරියෙකුට ගෙවීම් කළයුතුය. ඒ අතර

(ii) 2 ඡේදයේ දැක්වෙන දින තුනේ අවම සීමාව ඉවත් කෙරේ.

3. <u>කාර්යස්ථාන දීමනා.</u>

ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 2 වගන්තිය අනුව රජයේ
නිලධරයෙකුට ගෙවන කාර්යස්ථාන දීමනාව,
ඔහුගේ නව ඒකාබද්ධ වැටුපෙන් 10% (සියයට දහය) දක්වා වැඩි කෙරේ.

.....2

4. <u>අපියම් දීමනා.</u>

<u>1985.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි.</u>

ආයතන සංග්‍රහයේ x1v පරිච්ඡේදයේ 17:2 වගන්තිය අනුව රජයේ නිලධාරියෙකුට ගෙවන සහ සංස්ථා සේවකයෙකුට ගෙවන අපියම් වියදම් මෙසේ විය යුතුය.

| | රු. ශත |
|---|---|
| දුර ප්‍රමාණය සැතපුමකට වැඩි - | 10.00 |
| දුර ප්‍රමාණය සැතපුමකට අඩු - | 5.00 |

Siriwardhana

ලේකම්,

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.